# 11 වසර කෘෂි ආහාර තාක්ෂණය

## (4) කෘෂි බෝගවල පසු අස්වනු හානිය

අස්වනු නෙලීමේ සිට පාරිභෝගිකයා අතට පත්වන තෙක් අස්වැන්නට සිදු වන ප්‍රමාණාත්මක හා ගුණාත්මක හානි පසු අස්වනු හානි ලෙස හැඳින්වේ.

ලංකාවේ මෙය 20% - 40% - ඉහළ අගයක් ගනී.

පසු අස්වනු හානිය කෙරෙහි බලපාන සාධක

↓

පෙර අස්වනු සාධක

(නෙලීමට පෙර)

- අක්‍රමවත් ජල සම්පාදනය
- **නිසි ලෙස පොහොර නොයෙදීම**
- **පළිබෝධ හානි**
- **අහිතකර දේශගුණික තත්ව**
  **(අධික වර්ෂාපතනය, සුළං ආදිය)**
- නිරෝගී රෝපන ද්‍රව්‍ය භාවිතා නොකිරීම
- නිසි ලෙස බිම් සැකසීම නොකිරීම

පසු අස්වනු සාධක

* **අස්වනු නෙලීමේදී වන හානි**
* **අස්වනු පිරිසිදු කිරීමේදි**
* **අස්වනු ශ්‍රේණිගත කිරීමේදි**
* **අස්වනු ප්‍රවාහනයේදි**
* **අස්වනු ගබඩා කිරීමේදී**
* අස්වනු අලෙවියේදී

පසු අස්වනු සාධක ප්‍රධාන ආකාර දෙකකි

1) අභ්‍යන්තර සාධක - බෝගයේ ශ්වසනය, උත්ස්වේදනය,
   කායික ක්‍රියාවලි මගින් සිදුවන හානි
2) බාහිර සාධත - අයහපත් දේශගුණික සාධක,
   පළිබෝධ හානි
   අයහපත් පරිහරන විධි

## පසු අස්වනු හානි සිදුවන අවස්ථා

- නෙලීමේදී - නියමිත පරිනත අවස්ථාවේදී නෙලා නොගැනීම
  නෙලීමට සුදුසු උපකරණ භාවිතා නොකිරීම

  අයහපත් **දේශගුණික තත්ව ඇති විට අස්වනු නෙලීම**

- **පිරිසිදු කිරීමේදි -** **පිරිසිදු කිරීමේදි පිරිසිදු** ජලය භාවිතා නොකිරීම
  අල බෝග පමණට වඩා පිරිසිදු කිරීම

- ප්‍රවාහනයේදි - **එළවළු පලතුරු පමණ ඉක්මවාපැටවීම**
  දුෂ්කර මංමාවත්වල අධික වේලාවක් ප්‍රවාහනය
  අස්වනු මත මිනිසුන් නිදාගෙන යෑම

- ගබඩා කිරීමේදී - අස්වනු වර්ග කීපයක් එකම ස්ථානයක ගබඩා කිරීම
  නුසුදුසු ගබඩා තත්ව යටතේගබඩා කිරීම
  වාතනය දුර්වල වන පරිදි වක් ඇසුරුමක් තුළ විශාල අස්වනු
  ප්‍රමාණයක් ගබඩා කිරීම

- අලෙවියේදී - අධික හිරු එළිය, දූවිලි වලට නිරාවරණය වන පරිදි අලෙවි කිරීම
  නරක් වු එළවළු පළතරු සමග හොඳ අස්වනු මිශ්‍ර කර අලෙවි කිරීම

පැවරුම :- ඉහත දක්වා ඇති පෙර අස්වනු හානි හා පසු අස්වනු හානි වළක්වාගත හැකි

ක්‍රම 10 බැගින් වෙන වෙනම ලැයිස්තු ගත කරන්න